12 (1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. HRC/AP/120/2018 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021-02-18

පැමිණිලිකරු : පී.ඒ. තරිඳු මධුසංඛ ද සිල්වා,
අංක 11/1, වේවැල්දිගිලිය,
ගල්කුලම.

වගඋත්තරකරුවන් :

01. පොලිස් පරීක්ෂක බී.ඩී.පී.එස්. ධර්මකීර්ති මයා,
ස්ථානාධිපති,
අපරාධ විමර්ශන අංශය,
මූලස්ථාන පොලිසිය,
මාතලේ.

02. පොලිස් පරීක්ෂක ඩබ්.එම්.එන්. වනිගසේකර මයා,
පොලිස් ස්ථානය,
සූරියපුර (වර්තමාන)

03. උප පොලිස් පරීක්ෂක එස්.පී.එම්. තිලකවර්ධන මයා,
මූලස්ථාන පොලිසිය,
මාතලේ.

04. පොලිස් සැරයන් 8804 එන්.පී. ප්‍රේමසිරි මයා,
මූලස්ථාන පොලිසිය,
මාතලේ.

05. පොලිස් සැරයන් 59162 එස්.පී.ඩී. ඇනස්ලි රේමන් මයා,
පොලිස් ස්ථානය,
මාන්කුලම්.

06. පොලිස් සැරයන් 19259 ඩබ්.පී. දිසානායක මයා,
මූලස්ථාන පොලිසිය,
මාතලේ.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

07. පොලිස් කොස්තාපල් 35966 මුණසිංහ මයා,
පොලිස් ස්ථානය,
පුලියන්කුලම.

පැමිණිලි අංකය : HRC/AP/120/2018(S)

පැමිණිල්ල :-

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, 2017.10.13 වන දින රාත්‍රී 7.30 ට පමණ තමා නිවසේ නිදා සිටියදී නිවසේ දොරට මහ හඬින් ගසන ශබ්දයක් ඇසුණු බවත්, එම ශබ්දය නිසා තමා දොර ඇර බැලූ විට මාතලේ පොලිසියෙන් යයි පැමිණ සිටි පිරිස පැවසූ බවත්, එවිට පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණි හේතුව තමන් විමසූ අතර, එම අවස්ථාවේදී පොලිස් නිලධාරියෙකු එකවරම තම අතට මාංචු දමන ලද බවත්ය. අනතුරුව පොලිස් නිලධාරීන් තම පියා විසින් මිදුලේ දමා තිබුණු කැබිනෙට්ටුවක කොටස් කිහිපයක් සහ කුඩා ඇඳක් පෙන්වා එම බඩු සම්බන්ධයෙන් තම පියා අල්ලා ගැනීමට පැමිණි බව ප්‍රකාශ කරන ලද බවත් දක්වා ඇත.

පසුව පොලිස් නිලධාරීන් තම මුළු නිවසම පරීක්ෂා කර බලා කුස්සියට ගොස් ශීතකරණයේ තිබූ කෑම වර්ගද ආහාරයට ගත් බවත්, තමාට අමානුෂික ලෙස පරුෂ වචනයෙන් බැන වැදුනු බවත්, එක් පොලිස් නිලධාරියෙකු පැය දෙකක් පමණ තම නිවසේ කාමරයක නිදා ගත් බවත්, එමෙන්ම පොලිස් නිලධාරීන් දෙදෙනෙකු තමාගෙන් තුවායක් ඉල්ලා ගෙන එළියේ තිබූ ටැංකියෙන් නාගෙන සාලයට පැමිණ තම පියාට දුරකථන ඇමතුමක් ලබා ගෙන ඔහුට පරුෂ වචනයෙන් බැන වැදී කොහේ හිටියත් පැය 02 ක් ඇතුළත පොලිසියට පැමිණියේ නැතිනම් පුතාව අරගෙන ගොස් රිමාන්ඩ් කරන බව පැවසූ බවත්, එවිට තමා ව්‍යාපාර කටයුත්තක් සඳහා තම පියා මාතරට ගිය බව හා පසු දින පොලිසියට පැමිණිය හැකි බව ප්‍රකාශ කරන ලද බවත් සඳහන් කර ඇත.

නමුත් පොලිස් නිලධාරීන් විසින් තම නිවසේ කිසිවෙක් නොසිටියදී තමා ලවා ලොරියක් සොයා ගෙන කැබිනට් එක හා ඇඳ තමා ලවා ලොරියට පටවා ගෙන ඔවුන් පැමිණි වෑන් රථයෙන් තමාවද නංවා ගෙන මාතලේ පොලිසියේ අපරාධ අංශය වෙත රැගෙන ගිය බවත්, බඩු ගෙනා ලොරියේ කුලිය තමාගෙන් ඉල්ලා සිටි බවත්, ඒ අනුව තමා අත තිබූ රුපියල් 1000.00 (දාහක) මුදලක් තමා විසින් ඔවුන් වෙත ලබා දුන් බවත්, ඉතිරි මුදල තම මව විසින් ගෙවා තිබූ බවත් සඳහන් කර ඇත.

මාතලේ පොලිසියේ අපරාධ අංශයේ සිටියදී එහි ස්ථානාධිපති පැමිණ තමාගේ පියා අත්අඩංගුවට නොගත්තද, තමාව රිමාන්ඩ් කළ යුතු යයි පවසා පරුෂ වචනයෙන් බැන වැදුනු බවත්, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් පැමිණිල්ලක් දමා තිබුණොත් කුඩු නඩුවක් හෝ අත්බෝම්බයක් දමා ඉහළ අධිකරණයේ නඩුවක පටලවන බවට පොලිස් නිලධාරියෙකු කියා සිටින ලද බවත් සඳහන් කර ඇත.

තමා පොලිස් ස්ථානයේ සිටියදී තම මව තමා බැලීමට පැමිණි නමුත් මවට තමාව බැලීමට ඉඩ ලබා නොදී මවටද පරුෂ වචනයෙන් බැණ එලවා ගත් බවත්. සඳහන් කර ඇතග පසුදින තමාව අධිකරණය වෙත ඉදිරිපත් කළ අතර. එදින සවස පොදු බස් රථයක දමා ගෙන බන්ධනාගාර නිළධාරීන් දෙදෙනෙක් විසින් තමා සමග තවත් අයෙකු පල්ලේකැලේ බන්ධනාගාරය වෙත රැගෙන ගිය බවත් සඳහන් කර ඇති අතර. පැමිණිලිකරු මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිටින්නේ තමාට සිදු වූ මෙම අසාධාරණය සම්බන්ධයෙන් සොයා බලා සාධාරණය ඉටු කර දෙන ලෙසය.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම - අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මාතලේ පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් කොමිසම වෙත 2018.02.05 දිනැතිව වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, මාතලේ, උඩුගම පිහිටි ගිරාගම වලව්ව සොරුන් විසින් බිඳ එහි පැරණි ගෘහ භාණ්ඩ සොරාගෙන ගොස් ඇති බවට 2017.05.06 වන දින පැමිණිල්ලක් ලද බවත්. ඒ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කරන ලද විමර්ශනය අනුව ප්‍රශ්න කිරීම සඳහා පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බවත්ය.

අත්අඩංගුවට ගත් එම පුද්ගලයාගෙන් ලද තොරතුරු අනුව අත්අඩංගුවට ගත් සැකකරු සමග මෙම පැමිණිලිකරුගේ නිවස සොයා ගෙන ගිය බවද. එහිදී එම නිවසේ සිටි අයෙකු වන මෙම පැමිණිලිකරු විසින් අදාළ දේපල නිවස තුළට ඇද සැඟවීමට උත්සාහ දැරූ අතර. ඒ අනුව එම අවස්ථාවේදී සොර බඩු සැඟවීමට උත්සහ කරමින් සිටි මෙම පැමිණිලිකරු සොරබඩු සමග අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත.

මොහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අදාළ දේපල තම පියා වන ඇන්ටික් රාජා යන අයගේ බව ප්‍රකාශ කර ඇති බවත්, එවැනි අයෙකු ඉදිරිපත් කිරීමට මෙම පැමිණිලිකරු කටයුතු නොකළ බවත් සඳහන් කර ඇත. අනතුරුව අත්අඩංගුවට ගත් පැමිණිලිකරු ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවද දක්වා ඇත.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ නිළධාරීන්ගේ කරුණු දැක්වීම් :-

පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ. GCIB 305/77 යටතේ 2017.05.06 වන දින පැරණි ගෘහ භාණ්ඩ සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පොලිසිය වෙත ලද පැමිණිල්ලක් අනුව කරන ලද විමර්ශනයේදී අනාවරණය වූ කරුණු මත පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බවයි. එම අත්අඩංගුවට ගත් පුද්ගලයා විසින් ඇන්ටික් රාජා යන අය අදාළ භාණ්ඩ කැබ් රථයකින් විමලාවති යන අයගේ නිවසට රැගෙන ආ බවට ප්‍රකාශ කර ඇති බවද දක්වා ඇත. ඒ අනුව විමලාවති යන අයගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත්. එහිදී අදාළ භාණ්ඩ වලින් කොටසක්

ඇන්ටික් රාජා නොහොත් පී.ඒ. චන්ද්‍රලාල් ද සිල්වා යන අයගේ නිවසට රැගෙන ගිය බවට විමලාවතී යන අය ප්‍රකාශ කරන ලද බවත් දක්වා ඇත.

ඒ අනුව අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ මග පෙන්වීම මත පැමිණිලිකරුගේ නිවසට ගිය බවත්. එහිදී අදාළ සොරබඩු සොයා ගත් බවත්. අදාළ දිනයේ හා වේලාවේ මෙම පැමිණිලිකරුගේ නිවසේ පැමිණිලිකරු හැර වෙනත් කිසිවෙකු නොසිටි බවත්. ඒ අනුව මෙම පැමිණිලිකරු සොර බඩු ළඟ තබා ගැනීමේ වරදට අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ. තමා කිසිදු වරදක් කර නොතිබියදීත් වගඋත්තරකරුවන් තමාව අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවය.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, සොර බඩු ළඟ තබා ගැනීම, ළඟ තබා ගත් සොර බඩු සැගවීමට උත්සහ කිරීම යන චෝදනාව මත පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවත්, ඔහුගේ අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුව නොමැති බවත්ය.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව/දිවුරුම් ප්‍රකාශයන්/කොමිෂන් සභාව ඉදිරියේ පැවති පරීක්ෂණයේදී ලබා දී ඇති ප්‍රකාශ ආදියෙහි සඳහන් වන තොරතුරු විමසා බැලීමේදී නිවසක් බිඳ දේපල සොරකම් කිරීමක් පිළිබඳව පැමිණිල්ලක් මාතලේ මූලස්ථාන පොලිසියේ අපරාධ අංශය වෙත 2017.05.06 වන දින ලැබී ඇති බවට දක්වා ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් සිදු කර ඇති අතර, මෙම විමර්ශනයේදී වගඋත්තරකරුවන් වෙත ලද විශ්වසනීය තොරතුරු මත සොරකමකට සම්බන්ධ එක් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇති බවට දක්වා ඇත.

මෙකී අත්අඩංගුවට ගත් පුද්ගලයාගෙන් ලබා ගත් වැඩිදුර තොරතුරු මත වගඋත්තරකරුවන් ඉදිරි විමර්ශන ආරම්භ කර ඇති අතර, එහිදී තවත් එක් කාන්තාවකගෙන්ද ප්‍රකාශයක් ලබා ගෙන ඇත. එම ප්‍රකාශයේ සඳහන් කරුණු හා වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයාගේ තොරතුරුද පදනම්ව අදාළ සොරබඩු සෙවීම සඳහා පැමිණිලිකරු පදිංචිව සිටින 11/1, වේවැල්දිගිලිය, ගල්කුලම, අනුරාධපුර යන ලිපිනය වෙත 2017.10.13 දින වගඋත්තරකරුවන් පැමිණ ඇති බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ හා පැමිණිලිකරුගේ ප්‍රකාශ අනුව ඉහත සඳහන් දිනයේ වගඋත්තරකරුවන් අදාළ ස්ථානය වෙත පැමිණෙන විට පැමිණිලිකරු පදිංචිව සිටි නිවසේ වෙනත් කිසිදු පුද්ගලයෙකු සිට නොමැති බවද නිරීක්ෂණය වේ.

එමෙන්ම වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද විමර්ශනය අනුව පැමිණිලිකරු පදිංචි ලිපිනය වෙත වගඋත්තරකරුවන්ට පැමිණීමට හේතුව වී ඇත්තේ, අදාළ සොරකම සඳහා පැමිණිලිකරුගේ ලිපිනයේ පදිංචි ඇන්ටික් රාජා නොහොත් චන්ද්‍රලාල් ද සිල්වා යන අය එනම් පැමිණිලිකරුගේ පියා මෙම ලිපිනයේ පදිංචිව සිටීම හා මෙම ලිපිනය සහිත නිවස වෙත සොරකම් කරන ලද භාණ්ඩ රැගෙනවිත් තබා ගැනීම වන බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ විමර්ශනයට අදාළ උධෘත නිරීක්ෂණය කිරීමේදී අදාළ භාණ්ඩ සොරකම සඳහා ඇන්ටික් රාජා නොහොත් චන්ද්‍රලාල් ද සිල්වා යන අය සම්බන්ධ බවට ප්‍රකාශ දෙකක් ලැබී ඇත. ඒ අනුව මෙම සොරකමට චන්ද්‍රලාල් ද සිල්වා යන අය සම්බන්ධ බවට පැහැදිලි තොරතුරු වගඋත්තරකරුවන් සතුව තිබියදී 2017.10.13 වන දින පැමිණිලිකරු පදිංචි නිවස වෙත වගඋත්තරකරුවන් පැමිණ ඇති බවද පැහැදිලි වේ.

වගඋත්තරකරුවන් පැමිණිලිකරු පදිංචි ස්ථානයට පැමිණෙන විට සොරකම් කරන ලද භාණ්ඩ හමුවී ඇති අතර, එම භාණ්ඩ වන්නේ කැබිනෙට්ටුවක් සහ ඇඳක්ය. වගඋත්තරකරවන්ගේ ප්‍රකාශ අනුව වගඋත්තරකරුවන් පැමිණෙන විට මෙම භාණ්ඩ සැඟවීමට පැමිණිලිකරු උත්සහ දරණ ලද බැවිනුත්, සොරකම් කරන ලද භාණ්ඩ පැමිණිලිකරු ළඟ තබා ගත් බැවිනුත්, පැමිණිලිකරුව සොරකම් කරන ලද භාණ්ඩ ළඟ තබා ගැනීමේ වරදට වගඋත්තරකරුවන්ගේ අත්අඩංගුවට පත්වූ බවයි.

වගඋත්තරකරුවන්ගේ විමර්ශනයට අනුව ඇන්ටික් රාජා නොහොත් චන්ද්‍රලාල් ද සිල්වා යන අය සොරකමකට සම්බන්ධ පුද්ගලයා වේ. එමෙන්ම සොරකම් කරන ලද භාණ්ඩ තිබී ඇත්තේ ඇන්ටික් රාජා නොහොත් චන්ද්‍රලාල් ද සිල්වා යන අයට අයත් නිවසේය. මෙම පැමිණිලිකරු වෙත මෙම දේපල වල කිසිදු අයිතියක් තිබී නැත. පැමිණිලිකරු චන්ද්‍රලාල් ද සිල්වා යන අයගේ පුත්‍රයා පමණක් වන අතර, පැමිණිලිකරු කොළඹ ප්‍රදේශයේ රැකියාවක් කර නිවාඩුවක් සඳහා මෙදින නිවසට පැමිණ ඇති අයෙකු වන බවද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල සම්න්ධයෙන් පැමිණිලි පාර්ශවයෙන් ඉදිරිපත් කර ඇති ලේඛන සලකා බැලීමේදී වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ නිවස රජයේ නිළධාරීන්ට උචිත නොවන අයුතු පරිහරණයක් සඳහාද යොදා ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

01 මේ අනුව, දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සියලු කරුණු සලකා බැලීමේදී මාතලේ පොලිසිය වෙත භාණ්ඩ සොරකමක් සම්බන්ධයෙන් ලද පැමිණිල්ල අනුව වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද විමර්ශනයේදී පැමිණිලිකරු මෙම සොරකමට සම්බන්ධයක් පැවති බවට කිසිදු සාධාරණ තොරතුරක් වගඋත්තරකරුවන් වෙත ලැබී නොතිබියදී සහ මෙම සොරකමට චන්ද්‍රලාල් ද සිල්වා සම්බන්ධ බවට පැහැදිලි තොරතුරු ලැබී තිබියදී මෙම පැමිණිලිකරු චන්ද්‍රලාල් ද සිල්වාගේ පුතා වූ බැවින් හා චන්ද්‍රලාල් ද සිල්වා ගේ නිවසේ මෙදින පැමිණිලිකරු රැඳී සිටීම හේතුකොටගෙන පැමිණිලිකරු සොරබඩු ළඟ තබා ගත්තේය යන ව්‍යාජ චෝදනාවක් ඉදිරිපත් කරමින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම තුළින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් 'නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය' යන අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරනු ලැබේ. අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 32(1) 'ආ' ප්‍රතිපාදන අනුව අත්අඩංගුවට ගැනීම සාධාරණ සැකයක්, ඔත්තුවක් හා තොරතුරක් මත සිදුකළ යුතු බව දක්වා ඇත.

02 එමෙන්ම මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව අංක 51557 යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වන අතර, වගඋත්තරකරුවන් මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට හේතුව වී ඇත්තේ, සොරකම් කරන ලද භාණ්ඩ ළඟ තබා ගැනීමේ චෝදනාව වන නමුත් අංක 51557 දරණ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේ ලේඛනයේද සඳහන් කරුණු සලකා බැලීමේදී දිවා කාලයේ ගෙවල් බිඳීම, වටිනාකම් සඳහන් කළ නොහැකි භාණ්ඩ සොරකම් කිරීම යන චෝදනා ද පැමිණිලිකරු වෙත ගොනු කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම කරුණු ද සලකා බැලීමේදී පැමිණිලිකරු සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයකින් තොරව ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව දක්නට ලැබේ.

<u>තුෂාන් ඉන්දික එ. රංජන් විජේසේකර, ස්ථානාධිපති, පොලිස් ස්ථානය, පිටිගල</u> නඩුවේදී ද අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 32(1) 'ආ' පිළිබඳව සැළකිල්ලට බඳුන් කර ඇත. එහිදී පැහැදිලිව දක්වා ඇත්තේ වරෙන්තුවක් නොමැතිව යමෙකු අත්අඩංගුවට ගැනීමේදී ඔහු අත්අඩංගුවට ගන්නා කාරණය පිළිබඳව <u>සාධාරණ සැකයක්</u> මත පමණක් අත්අඩංගුවට ගත යුතු බවය. මෙම තත්වය තවදුරටත් <u>බන්දුල සමරසේකර එ. විජිත අල්විල් ස්ථානාධිපති, ගිණිගත්හේන පොලිස් ස්ථානය ඇතුළු තවත් අය</u> SCFR 107/2007 හිදී සාකච්ඡා කර ඇත. මෙලෙස පැමිණිලිකරුට එරෙහිව චෝදනා ගොනු කිරීම තුළින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් 'නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක වීම සර්ව සාධාරණ විය යුත්තේය' යන සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තරකරුවන් විසින් පැමිණිලි පාර්ශවය වෙත රු 20,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පති සහ සභාපති-ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2021.03.18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
... of Sri Lanka

පිටපත -: 01 පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

02 සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 07

} නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන් වෙත යොමු කිරීම සහ අවශ්‍ය පියවර ගැනීමට

B/